සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය - I පත්‍රය

නම/විභාග අංකය .................................................... කාලය : පැය 01 යි.

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.

---

1. නබි මුහම්මද් (සල්) තුමා කුඩාවියේ සිට අල් අමීන් යනුවෙන් හැඳින්වෙන්න හේතුව
   1. සත්‍ය කතා කිරීම
   2. අනාථයෙකු බැවින්
   3. අවංකභාවය නිසා
   4. සමාජ සේවයේ නිරත වූ බැවින්

2. ඇබිසීනියා සංක්‍රමණයෙහි මුස්ලිම්වරුන්ට ආරක්ෂාව සැපයූ ඉතියෝපියානු රජතුමා
   1. හිරක්ල්
   2. මුකව්කිස්
   3. අබ්රහා
   4. නජ්ජාෂි

3. 'මහිමය හිමිවන මාගේ පරමාධිපතියානන්ව සුවිශුද්ධකර. ඔහුව පසසමි' යන අරුත දෙන ඉසිරීම උසුරණ සලාතයේ ඉරියව්ව
   1. අත්තහිය්යාත්
   2. රුකූඋ
   3. ඉඃතිදාල්
   4. සුජූද් දෙක අතර හිඳුම

4. මූමින්වරුන්ගේ සලකුණක් වශයෙන් සැලකෙන වගකීම
   1. උපවාසය
   2. හජ්
   3. සලාත්
   4. සකාත්

5. නබි මුහම්මද් (සල්) තුමාණන්ට ප්‍රථමයෙන් පහළ කරන ලද වැකිය
   1. අලිෆ් ලාම්මීම්
   2. අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්
   3. යා අයියුහල් මුද්දස්සිර්
   4. ඉක්රඃ බිස්මි රබ්බිකල්ලදී හලක්

6. ඉද්රීස් (අලෛ), හීද් (අලෛ) යන නබිවරුන්ට පහළවූ සුහුෆ් සංඛ්‍යාව පිළිවෙලින්.
   1. 10, 10
   2. 10, 30
   3. 10, 50
   4. 30, 50

7. සලාතයේ සෑම රකඅත්හිම අනිවාර්යයෙන්ම පාරායනා කළ යුතු සූරාව
   1. සූරා නාස්
   2. සූරා ෆලක්
   3. සූරා ෆාතිහා
   4. සූරා ඉක්ලාස්

8. දෙවෙනි අකබා ගිවිසුමෙහි ඉස්ලාමය වැළඳගත් අයගේ සංඛ්‍යාව
   1. 6
   2. 72
   3. 12
   4. 62

9. කලීෆා අබූබක්ර් (රලි) ගේ යුගයේ අල්-කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීම සඳහා අදහස් එල කළේ

1. උස්මාන් (රලි)
2. සෙයිද් බින් සාබිත් (රලි)
3. උමර් (රලි)
4. මුආද් බින් ජබල් (රලි)

10. මිඃරාජ් සිදුවූ මාසය

1. මුහර්රම්
2. ෂව්වාල්
3. රජබ්
4. රමළාන්

11. ' මුත්තසදූන් හජ්ජ් ' යන පදයෙහි අර්ථය

1. විත්තග සටන
2. සිහින් තරක සටන
3. අවි සටන
4. උපවාසය

12. පහත සඳහන් කරුණු අතරින් සාමාන්‍ය නජිස් වන්නේ

1. නින්දෙන් මෝචනය වීම
2. නිවසේ හැදෙන බල්ලාගේ කෙළ
3. මව්කිරි පමණක් ආහාරයට ගන්නා පිරිමි ළදරුවාගේ මුත්‍රා
4. වමනය

13. ආයතුල් කුර්සියෙහි සඳහන් වන අල්ලාහ්ගේ අලංකාර නාම දෙකක්

1. අල්කුද්දූස් , අස්සලාම්
2. අල් අලී , අල් අලීම්
3. අල් මුඃමින්, අල් මුහයිමින්
4. අර්රහ්මාන්, අර්රහීම්

14. ජාහිලිය්‍යා යුගයේ අල්ලාහ්ට ආදේශ කිරීම් කටයුතුවල නොහැසිරුණු අය

1. හවාරිය්‍යූන්
2. මුරිද්වරු
3. හුනෆා(හනීෆ්වරු)
4. අසම්වරු

15. හබ්ෂා (ඇබිසීනියා) වෙත මුස්ලිම්වරු සංක්‍රමණය වූ වසර දෙක පිළිවෙලින්

1. නුබුව්වත් 5,7
2. නුබුව්වත් 5,6
3. නුබුව්වත් 6,8
4. නුබුව්වත් 4,5

16. ' සීරතු රසූලුල්ලාහ් ' යන ප්‍රථම ග්‍රන්ථය රචනා කළ කතෘවරයා

1. ඉබ්නු කසීර්
2. ඉබ්නු ඉස්හාක්
3. ඉබ්නු හිෂාම්
4. ඉබ්නු තෛමියා

17. අවසාන අත්තහිය්‍යාත් හිඳුම

1. ඉෆ්තිරාෂ්
2. ඉක්ආඃ
3. තවර්රුක්
4. අල් ඉස්රාද්

18. මුහම්මද් (සල්) තුමාට ප්‍රථමයෙන්ම වහී පහළවූ ස්ථානය

1. මිනා
2. හිරා
3. සවුර්
4. සෆා

19. ' ඉක්ලාස් ' නැමැති පදයෙන් අඟවන්නේ

1. භාරකිරීම
2. පිරිසිදු චේතනාව
3. තෘප්තිය
4. පවිත්‍රවීම

20. පහත සඳහන් කරුණු අතරින් ' අර්කානුල් තියාස්ති ' අඩංගුවන්නේ
1. අල් මලාඉකත් 2. අල්කදර්
3. අල්කියාමත් 4. අල් අමානත්

21. කුර්ආනය හා බැඳුණු කරුණු අතරින් ' තර්තීබුත් තිලාවත් ' යනු?
1. කුර්ආන් නබිතුමාට පහළවූ පිළිවෙල 2. කුර්ආන් ගොනුකරන ලද ඉතිහාසය
3. කුර්ආන් පාරායනා කිරීමේ පිළිවෙල 4. කුර්ආනය තේරුම් ගැනීමේ පියවර

22. ' අධික ජලය ' යන අරුතය දෙන අරාබි පදය
1. අල්මාඋල් කලීල් 2. අල්මාඋල් මුස්තාමල්
3. අල්මාඋත් තාහිර් 4. අල්මාඋල් කසීර්

23. මුහම්මද් (සල්) තුමා මක්කාවෙහි වෙසූ කාලය
1. වසර 11 කි 2. වසර 40 කි
3. වසර 53 කි 4. වසර 20 කි

24. ඉස්ලාමීය මූලාශ්‍රයන් අතරින් තුන්වන ස්ථානය දරන්නේ
1. අල් කුර්ආන් 2. ඉජ්මා
3. සුන්නාහ් 4. කියාස්

25. මුහම්මද් (සල්) තුමා තම අවසන් දේශනය පැවැත්වූ ස්ථානය
1. හිරා කන්ද 2. මර්වා කන්ද
3. අරෆා පිටිය 4. උහද් කන්ද

26. නබි මුහම්මද් ( සල්) තුමාණන්ගේ පවුලේ අය හට අර්ථික සම්බාධක පනවා ගවුන්ව සිරකර තැබූ ස්ථානය
1. දාරුන් නද්වා 2. ෂිඃබු අබූතාලිබ්
3. දාරුල් අර්කම් 4. ෂිඃබු නම්ලා

27. ' නෆ්සුල් ලව්වාමා ' යන අරාබි පදයෙන් අඟවන්නේ
1. අයහපත පතවන සිත 2. තමන්ව විදවගන්නා සිත
3. තෘප්තියට පත් සිත 4. සිහියට පත් සිත

28. මුස්ලිම්වරයෙකු විසින් ඉටුකළ යුතු වගකීම් අතරින් තිලාගත් යනු
1. පොළොව සරු කිරීම 2. අල්ලාහ්ට අවනත වීම
3. අල්ලාහ්ගේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කිරීම 4. අල්ලාහ්ගේ සිරි ක්‍රියාකිරීම

29. ඉස්ලාමීය අකීදාවෙහි පවිත්‍රත්වය රැකගැනීමෙහිලා කැපවූ සම්බන්ධ නොවූ විද්වතා
1. අබූ මන්සූර් අල් මාතුරීදි 2. අබුල් හසන් අල් අෂ්අරී
3. අබුල් හසන් අස්සාදුලි 4. අහ්මද් බින් හන්බල්

30. පළමුවෙනි අකබා ගිවිසුමෙන් පසුව නබිතුමා මදීනාවට යැවූ සහාබිවරයා
1. අලි (රලි) 2. උස්මාන් (රලි)
3. ජාෆර් (රලි) 4. මුස්අබ් (රලි)

31. ඉස්ලාමීය ප්‍රචාරය සඳහා තාඉෆයට ගොස් පැවත මක්කාවට පැමිණි නබිතුමාට ආවාසය සපයා සහාය වූයේ.
1. මුත්ඉම් ඉබ්නු අදී 2. වලීද් බින් මුගීරා
3. උමයියා බින් කලෆ් 4. සෆ්වාන් බින් උමයියා

32. අල් - කුර්ආනය ගොනුකිරීමේ ක්‍රියාවලියට භාරව කටයුතු කළ සහාබිවරයා
1. සෙයිද් බින් සාබිත් (රලි)
2. අබ්දුල්ලාහ්බින් උමර් (රලි)
3. අබ්දුල්ලාහ් බින් අබ්බාස් (රලි)
4. උස්මාන් (රලි)

33. ඊමානයෙහි උස්සම තත්වය කලිමා වන අතර එහි අවම අංගය වන්නේ.
1. දෙමව්පියන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීම
2. පතිව්‍රත රැකීම
3. වැඩිහිටියන්ට ගරු කිරීම
4. මාර්ගයෙන් හානි පමුණුවන දෑ ඉවත් කිරීම

34. ' ඉජ්මාඋස් ' යන්න යනු
1. පැහැදිලි තීන්දුව
2. මනුෂ්‍යයන්ගේ තීන්දුව
3. නිහඬ තීන්දුව
4. එක්වූ ගත් තීරණය

35. ෆර්ලු කිෆායාවට අයත් නොවන ක්‍රියාවකි.
1. ආගමික විද්වතුන් බිහිකිරීම
2. කෘෂිකර්මයෙහි යෙදීම
3. ජනාසාවෙහි යුතුකම් ඉටු කිරීම
4. පවුල රැක බලාගැනීම

36. ආධ්‍යාත්මික පිරිසුදුව සඳහා වූ මාර්ගයන් අතරින් ' වරඋ ' යනු
1. රැකීම
2. මෙලොව ඇල්මක් නැති ජීවිතය
3. ඒකදේවත්වය
4. චිත්තපාරිශුද්ධිය

37. ' අල් කයියූම් ' යන අල්ලාහ්ගේ අලංකාර නාමින් අර්ථවත් වන්නේ
1. ජීවමානවීම
2. අති උසස්වීම
3. අති ශ්‍රේෂ්ඨවීම
4. සදාකාලිකවීම

38. මුස්ලිම්වරු සහ කුරෙයිෂ්වරු අතර සිදු වූ ගිවිසුම
1. මදීනා ප්‍රඥප්තිය
2. අකබා ගිවිසුම
3. බයිඅතුර් රිල්වාන්
4. හුදෙයිබියා

39. ' රබ්බු ' යන පදයෙන් අඟවන්නේ
1. පරමාධිපති
2. මැවුම්කරු
3. දෙවියා
4. ආහාරපදායකයා

40. පහත සඳහන් අරාබි පද, තේරුම සමඟ යා කරන විට නිවැරදි පිළිතුර වනුයේ,

| | | | |
|---|---|---|---|
| 1. | තෞබා | A. | ආදේශකරන්නා |
| 2. | කබීලා | B. | පාපොච්චාරණය |
| 3. | සුලම් | C. | ගෝත්‍ර |
| 4. | මුෂ්රික් | D. | පවුර (රුවුම) |

1. BCDA
2. ABCD
3. CDAB
4. BADC

( 1 x 40 = 40 )

911

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 10 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය - II පත්‍රය

නම/විභාග අංකය :- ............................................................ කාලය : පැය 02 යි.

- පළමුවෙනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවෙනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

1. ඉබාදත්හි ප්‍රධාන වර්ග උදාහරණ සමග සඳහන් කරන්න.
2. ඉජ්මාඃ හි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.
3. නබිතුමාගේ සියලුම දුක් කරදරවල සහ සියලුම කටයුතු වල සහයෝගය දැක්වූ දෙදෙනෙක්ව නම් කරන්න.
4. ඉජ්තිහාද් පදනමින් බිහිවූ සහායක මූලාශ්‍රයන් දෙකක් සඳහන් කරන්න.
5. නොමඟ ගිය අකීදා කණ්ඩායම් හතරක් නම් කරන්න.
6. සලාතයේ වාචිකව පිටකරන ෆර්ල් දෙකක් සඳහන් කරන්න.
7. අරාබි අර්ධද්වීපයේ මායිම් කුමක්ද?
8. මුස්ලිම්වරයෙකු අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු යහගුණ දෙකක් සඳහන් කරන්න.
9. ඉස්ලාමීය අකීදාවට පදනම්වන මූලාශ්‍රයන් දෙකක් සඳහන් කරන්න.
10. ' රිසාලත් ' , ' හිදායත් ' යන අරාබි පදයන්හි තේරුම ලියන්න.

(2 x 10 = 20)

(02) 1. ඉස්ලාමීය අකීදාවට පටහැනිව විකෘති චින්තන කණ්ඩායම් බිහිවීමට හේතු දක්වන්න.

2. තෞබා සඳහාවූ කොන්දේසි සඳහන් කරන්න.

3. විශ්වාසයේ ප්‍රධාන කරුණු 6 සහ ඒවා අඩංගු වන මාතෘකා පදය ද සඳහන් කරන්න.

(2+3+5 = 10)

(03) 1. ෆර්ලු ඓන් වර්ගයට උදාහරණ සඳහන් කරන්න.

2. ඉබාදත්හි අරමුණු 3ක් සඳහන් කරන්න.

3. දෛනික කටයුතු ඉබාදත්වීමට තිබිය යුතු කොන්දේසි පහදන්න.

(2+3+5 = 10)

(04) 1. චිත්ත පාරිශුද්ධියේ වැදගත්කම පෙන්නුම් කරන හදීසයක් සඳහන් කරන්න.

2. දානමය කිරීමෙන් අත්වන යහපත පහදන්න.

3. චිත්ත පාරිශුද්ධිය රැකගැනීමට අපි කළ යුතු කරුණු සඳහන් කරන්න. (2+3+5 = 10)

(05) 1. ' වහි ' යන පදයෙහි අර්ථ පැහැදිලි කරන්න.

2. වහි පහළවන මාර්ගයන් කුමක්ද?

3. සියාමේ අරමුණු ,නිදසුන් සමග පහදන්න. (2+3+5 = 10)

(06) 1. නබිතුමා ප්‍රචාරක කටයුතු සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ග පහදන්න.

2. හිජ්රාව හැදෑරිය යුතු හේතු කරුණු සඳහන් කරන්න.

3. ජාහිලියියා යුගයෙහි අරාබිවරුන් තුළ දක්නට ලැබූ යහපත්, අයහපත් ගති පැවතුම් ලැයිස්තුගත කරන්න.

(2+3+5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරා කෙටියෙන් විස්තර කරන්න.

1. ශුක්‍ර්!

2. සුන්නත්

3. අබුබක්ර් (රලි) ගේ යුගයේ කුර්ආනය ගොනු කිරීම.

4. ඉස්ලාමයට පෙර අරාබිකරයේ ආගමික තත්වය (5+5 = 10)